**දෙවිනුවර ප්‍රාදේශීය සභාව - 2020**
-----------------------------------

**1. මූල්‍ය ප්‍රකාශන**
-----------------

**1.1. තත්ත්වාගණනය කළ මතය**
-------------------------------

දෙවිනුවර ප්‍රාදේශීය සභාවේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට දෙවිනුවර ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2. තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**
-----------------------------------------------

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**
--------------------------------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම්, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4. විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

-----------------------------------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම් අගයන ලදී.

  හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කල ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකි වන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍යයන් සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පතනේ 6(1)(ඇ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව, ඉකුත් වර්ෂයේදී මා විසින් සිදු කරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**1.6.1 ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | සමාලෝචිත වර්ෂයේදී සභාවට අයත් කපුගම බටහිර වේහැල්ල ප්‍රධාන රථගාල ඉදිකිරීම වෙනුවෙන් දරන ලද රු.1,932,778 ක මුදල ඉඩම් හා ගොඩනැඟිලි යටතේ ප්‍රාග්ධනිත කර නොතිබුණි. | 2021 වර්ෂයේ අවසන් ගිණුම පිළියෙල කිරීමේ දී නිවැරදි කරන බව. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ආ) | 2019 වර්ෂයේ කපුගම පුස්තකාලය සංවර්ධනය කිරීම වෙනුවෙන් දරන ලද රු.311,315 ක මුදල සමාලෝචිත වර්ෂයේදී ද ප්‍රාග්ධනිත කර නොතිබුණි. | | |
| (ඇ) | සමාලෝචිත වර්ෂය අවසානයට පොදු ගබඩා තොගය ගණනය කිරීමේ දී සිදු වූ අඩුපාඩු හේතුවෙන් පොදු ගබඩා තොග අගය රු.1,106,449 ක් වැඩියෙන් දක්වා තිබුණි. | ගබඩා විෂය මගින් තොරතුරු ලබා දීමේ දී සිදුවූ දෝෂයන් බවත්, ඉදිරියේ දී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | |

**1.6.2. විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| එකතුව රු.18,925,338 ක් වූ ගිණුම් විෂයයන් 03 කට අදාලව විගණනයට අවශ්‍ය තොරතුරු ඉදිරිපත් කර නොතිබුණි. | ඉඩම් හා ගොඩනැඟිලිවලට අදාලව නව පිරිවැය තක්සේරු කිරීමටත්, කමිටුවක් මගින් භෞතිකව පවතින සියලු වත්කම් හඳුනාගෙන ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කිරීමට කටයුතු කරන බව. | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කළ යුතුය. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.25,266,485 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදමට වඩා වැඩිවූ ආදායම රු.31,245,653 ක් විය.

**2.2 ආදායම් පරිපාලනය**

**ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය**

**(අ) වරිපනම්**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය අවසානයට රු.4,994,262 ක් වූ හිඟ වරිපනම් බදු අය කර ගැනීමට සභාව කටයුතු කර නොතිබුණි. | වසංගත තත්වය ඉවත් වූ පසු හිඟ අය කර ගැනීමට කටයුතු කරන බව. | හිඟ ආදායම් කඩිනමින් අය කර ගත යුතුය. |

**(ආ) අක්කර බදු**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය අවසානයට රු.69,093 ක් වූ හිඟ අක්කර බදු අය කර ගැනීමට සභාව කටයුතු කර නොතිබුණි. | අක්කර බදු ලේඛණයේ අයිතිකරුවන් සහ ඉඩම් පිලිබඳ පැහැදිලි තොරතුරු නොමැති කමින් ලේඛන නඩත්තු කළ නොහැකි බව. | හිඟ ආදායම් කඩිනමින් අය කර ගත යුතුය. |

(ඇ) කුලී
------

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | සමාලෝචිත වර්ෂය අවසානයට රු.11,786,219 ක් වූ හිඟ කුලී අය කර ගැනීමට සභාව කටයුතු කර නොතිබුණි. මෙම වටිනාකම අදාළ උපලේඛනයේ දැක්වෙන ශේෂය රු.10,891,560 ක් විය. | කොරෝනා වසංගත තත්ත්වය සමනය වූ පසු හිඟ අය කර ගැනීමට කටයුතු කරන බව. | හිඟ ආදායම් කඩිනමින් අය කර ගත යුතුය. |
| (ii) | සභාව සතු කඩ කාමර කුලියට ලබාදීමේදී ගිවිසුමේ 23 වන වගන්තිය ප්‍රකාරව අතුරු බදුදීම් නොකළ යුතු වුවත් වෙළඳ සංකීර්ණ 03 කට අයත් කඩ කාමර හා බිම් අල්ලි 07 ක් ඒවායේ හිමිකරුවන් 06 දෙනෙකු විසින් සභාවේ අනුමැතියකින් තොරව සභාව අය කරන මාසික කඩ කුලියට වඩා වැඩි කුලියකට බදු දී තිබුණි. | ඉදිරියේදී එය නිවැරදි කිරීමට කටයුතු කරන බව. | ගිවිසුමේ 23 වන වගන්තිය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (iii) | සභාව සතු පැරණි වෙළඳ සංකීර්ණයට අයත් කඩ කාමර 06 ක්, නව වෙළඳ සංකීර්ණයට අයත් කඩ කාමර 15 ක්, නව වෙළඳ සංකීර්ණය පිටුපස බිම් අල්ලි 08 ක් හා පැරණි වෙළඳ සංකීර්ණය පිටුපස බිම් අල්ලියක් වශයෙන් කඩ කාමර 30 ක් දීර්ඝ කාලයක සිට ව්‍යාපාර කටයුතු නොකර වසා දමා තිබුණි. | ඉදිරියේදී ඒ පිළිබඳව සැලකිල්ලට ගෙන කටයුතු කරන බව. | කඩ කාමර බදු දීම හා නඩත්තුව විධිමත් පරිදි සිදු කළ යුතුය. |

3. මෙහෙයුම් සමාලෝචනය
---------------------------

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුඛ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

3.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා
-------------------------------

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දඹුල්ල හා නුවරඑළිය ප්‍රාදේශීය ලේකම්වරු විසින් බෙදාහැරීම සඳහා ගොවීන්ගෙන් මිලට ගෙන තිබූ රු. 1,586,348 ක එළවළු තොග නොමිලේ බෙදා හැරීමේදී කොට්ඨාශයේ ග්‍රාම නිලධාරී, ආර්ථික සංවර්ධන නිලධාරී හා සමෘද්ධි සංවර්ධන නිලධාරිගේ නිර්දේශ ලබාගෙන නොතිබූ අතර එම | සභාවේ මන්ත්‍රීවරුන්ගේ සහයෝගය මත එළවළු බෙදා දීම සිදු කළ බවත්, හානි වූ එළවළු ප්‍රමාණය පිළිබඳව පරීක්ෂණ මණ්ඩලයක් මගින් පරීක්ෂණ සිදු කිරීමට අවස්ථාවක් නොවූ බව. | විධිමත් ක්‍රමවේදයක් අනුගමනය කළ යුතුය. |

එළවළුවලින් කිලෝ 728,100 ක් විකුණා 2020 ජූලි 01 දින වන විට ප්රාදේශීය ලේකම් කාර්යාල දෙක වෙත රු. 567,100 ක් ප්‍රේෂණය කර තිබුණි.

**3.2 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේදී සපිරි ගමක් ප්‍රජා පාදක ග්‍රාමීය සංවර්ධන වැඩසටහන යටතේ රු.3,387,627 ක ඇස්තමේන්තුගත වටිනාකමකින් යුත් මාර්ග 07 ක කොන්ක්‍රීට් පරීක්ෂණය අනුව ඉන් මාර්ග 05 ක නිශ්චිත ඝනකම හා ශක්තිය නොතිබුණි. | නිශ්චිත ඝණකම නොතිබුණු මාර්ග 05 හි හා අනිකුත් මාර්ග 02 හි බිල්පත් සඳහා කිසිඳු ගෙවීමක් සිදු කර නොමැති බව. | ඇස්තමේන්තු ප්‍රකාරව ඉදි කිරීම නියමිත ප්‍රමිතියට සිදු කළ යුතුය. |

**4. ගිණුම්කටයුතුභාවය හා යහපාලනය**

**4.1 පාරිසරික ගැටළු**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභා බල ප්‍රදේශය තුළ දෛනිකව එක්රැස් කරන දිරාපත් වන කසල භාවිතා කර කොම්පෝස්ට් පොහොර නිෂ්පාදනය කිරීමටත් හා නොදිරන කසල ප්‍රතිචක්‍රිකරණයට යොමු කිරීමත් සඳහා ස්ථිර හා විධිමත් කසළ කළමනාකරණ ව්‍යාපෘතියක් සභාව විසින් ක්‍රියාත්මක කර නොතිබුණු අතර ඒ වෙනුවට දෛනිකව එක්රැස් කරන ටොන් 3 ½ ක් පමණ දිරාපත් වන හා දිරාපත් නොවන කසළ ලෙස වර්ගීකරණය කිරීමකින් තොරව මාතර ප්‍රාදේශීය සභාවට අයත් වගුරුබිමකට බැහැර කරමින් තිබුණි. | දිරන කසළ පමණක් අදාල ස්ථානයට බැහැර කරන බවත්, එම නොදිරන කසළ මාසිකව එකතු කර කොටවිල කසළ ප්‍රතිචක්‍රීකරණ මධ්‍යස්ථානයට භාර දෙනු ලබන බවත්. | විධිමත් පරිදි කසල බැහැර කිරීම සිදු කළ යුතුය. |